# සුගන්ධිකා



# සුගන්ධිකා

W.M.බොවින්දි ජනාංගා වීරකෝන්

# සුගන්ධිතා

## W.M.බොවින්දි ජනාංගා වීරකෝන්

කතෘ

ශ්‍රේණිය - 10

පාසල - බප / හො/ නාහල්ල ශ්‍රී රේවත මහ විදුහල.

කෘතිය පල කරන දිනය - 2025.02.08

## ...පලමු දිග හැරුම...

ISBN: 978-624-208-520-3

# -පිදුම-

**කුඩා කල සිට මා සාහිත්‍ය කලාවට යොමු කර මගේ මෑණියන්ට සහ පියාණන්ටත්, මට අත හිත දුන් සියලුම දෙනාටත්, මගේ ආදරණීය විදු මාතවටත්,මෙම ව්‍යාපෘතිය හඳුන්වාදුන් ආදරණීය මහමායවන්ටත් ගෞරවයෙන් යුතුව පුදමි...**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසා ය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණයෙන් විස්කම් පෑම එයට හේතුව යි.පාසල තුල පොත් ලියන සංකෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කර්තෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේ ට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නඟන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීමෙනි විදුහල්පතිනිය වශයෙන්  මා හට මහත් අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අනාගත දිවිය සඳහා අත් වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# ....පටුන....


| | |
|---|---|
| 01 වැනි පරිච්ඡේදය | 01 |
| 02වැනි පරිච්ඡේදය | 04 |
| 03වන පරිච්ඡේදය | 06 |
| 04වන පරිච්ඡේදය | 08 |
| 05වන පරිච්ඡේදය | 10 |
| 06 වන පරිච්ඡේදය | 12 |
| 07වනපරිච්ඡදය | 14 |
| 08 වන පරිච්ඡේදය | 16 |
| 09 වන පරිච්ඡේදය | 18 |
| 10 වන පරිච්ඡේදය | 19 |

# 01 වැනි පරිච්ඡේදය

"නොරින්.."

" ම්ම්.."

"ඔයා දැන් ලෑස්ති කරගෙනද තියෙන්නේ අනිද්දට ගෙනියන දේවල්..?"

ඇඳුම් ටික ඇරෙන්න අනිත් හැමදේම ලෑස්ති කරා හැරී..ඔයාට මහන්සි නැත්තං යමු මං ඇඳුම් ටික හදන්න.."

"ම්ම් යමු.. මං ඔයාට දෙයක් කියන්න කියලා හිටියේ නෝරින් දැන් මට මතක නෑනේ.."

"හරි ෂෝක්.."නොරින් සිනා සෙමින් පැවසීය..

එයට පිළිතුරු ලෙසට සිනා සෙමින් හැරී ඔවුන් ගේ නිදන කාමරයේ ඇති සුවිසල් ඇඳ මතට බර වුණි..

" ආ.. මේ.. මං අහන්න කියලා හිටියේ...හුඟ කාලෙකින් දළදා මාළිගාවට යන්න බැරි වුණා..හෙට ගියාම යමුද...? නොරින් විමසිය..

" යමු එකේ ප්‍රශ්නයක් නෑ.." හැරී පිළිතුරු දුනි..

" හ්ම්ම්..මේ..අනිද්දට අම්මා බලන්න අක්කලත් එනවලු..මට දවල් කතා කරපු වෙලේ නංගි කිව්වේ.." නොරීන් පැවසීය..

" ම්ම්.. එහෙමද..? " හැරී පැවසීය.

නොරීන් සහ හැරී නොහොත් වික්‍රමසිංහ යුවළ යනු කොළඹ ප්‍රදේශයේ පදිංචිව සිටින ඉතාමත් සාමකාමී අඹුසැමි යුවළකි...නොරීන් උපන්නේත් හැදී වැඩුනේත් කොළඹ වන අතර හැරී නුවරඑළියේ උපත ලැබූ පුද්ගලයෙකි..ඔවුන් ඉතාමත් ධනවතුන් වන අතර ව්‍යාපාරික කටයුතු සඳහා ඇති පහසුව හේතුවෙන් ඔවුන් කොළඹ පදිංචිව සිටිති.

ඔවුන් සෑම මසකටම වතාවක් නුවරඑළියේ සහ මිද්දෙනියේ යන අතර නුවර එළියේ වින්චැටෝ බංගලාවත්, මිද්දෙනියේ වින්චැටෝ රෙස්ට් නම් වූ නවාතැන් පලත්, කුරුණෑගල ප්‍රදේශයේ පොල්වතු ගණනාවකුත්, ඔවුන් පදිංචිව සිටින කොළඹ බංගලාවත් ඔවුන්ගේ වත්පොහොසත්කම් මැනවින් කියාපායි..

"ට්‍රීං... ට්‍රීං... ට්‍රීං..." දුරකථනය නාද වන්නට විය.

" හලෝ " හැරී දුරකථනයට පිළිතුරු දුනි.

" ආ..කියන්න.."

"Okey..Okey..It's Okey..අපි ගෙදර ඉන්නවා.."

"ඔන්න Family එකම අනිවරෙන් එන්න.."

"අපි Dinner එක ලෑස්ති කරනවා.."

"අනේ..පිස්සුද..එහෙමකරදරයක් නෑ....okey..okey..හරි..බුදුසරණයි..පරිස්සමින් එන්න..." කියමින් දුරකථන සංවාදය අවසන් කර හැරී රිසීවරය තැබිය..

"ලෙස්ලිල එනවලු නොරීන්... මං Dinner එක redyකරන්නම් කිව්වා..මන් පණිවිඩේ දීලා එන්නම් Dinner එක redy කරන්න කියලා...

" ආනේ එහෙමද..?මේ යමුද ටක් ගාලා ටව්න් එකට ගිහින් එන්න..ලෙස්ලිගේ බබාලා දෙන්න පුඩිං කන්න හරි ආසයි..මන් ඒ නිවුන් බබාල දෙන්නට හරිම ආදරෙයි හැරී.. මං අද එයාලට මගේ අතින්ම පුඩිං හදලා දෙනවා..එකට බඩු ටිකක් ගන්න ඕනේ..."නොරීන් පැවසීය..

"හ්ම්ම්..යමු එහෙනම්..මොනවද ගන්නේ..." හැරී විමසිය..

"පොඩි බඩු වගයක්.." නොරීන් පැවසීය..

රාත්‍රී ආහාරයට තවත් සිව් දෙනෙකු එක් වන බව සේවිකාවන්ට පවසා ඔවුන් දෙදෙනා තම මොරිස් මයිනර් රථයට ගොඩ විය.

ඉක්මනින්ම වෙළඳසැල අසලට පැමිණි ඔවුන් රථයෙන් බැස වෙළඳපොළට ගොඩ විය.විවිධ වර්ගයේ ටොෆි රාශියකුත්, චොක්ලට් පෙට්ටියකුත්, පලතුරු වර්ග කීපයකුත්, විවිධ රසකැවිලි වර්ගත්, පුඩිං සෑදීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වර්ගත් මිල දී ගත් ඔවුන් වෙළඳ සැලෙන් එළියට පැමිණියහ..එවිටම නොරීන් ට හද සසලවන සුළු දසුනකට මුහුණ පාන්නට සිදු විය..ඉවත දමන ආහාර ඇති පෙට්ටියක් අසල පැදුරු කඩක් එලා ගත් කුඩා දරුවෙක් සහ අම්මා කෙනෙක් විය..අම්මා කුණු බාල්දි තුළ ඇති ඉවත දැමූ ආහාර රැගෙන තම දරුවාට ආහාරයට ගැනීමට දෙන්නීය..මෝටර් රථය දෙසට ඇවිද යමින් සිටි හැරී ගේ අතින් ඇදි නොරීන් එය ඔහුට දැක්වීය..දරුපල නොමැති ඔවුන් හට එය හද කම්පිත කරවන සුළු විය..

" අපි ඒ අයට මොනවා හරි අරන් දෙමුද හැරී..අනේ අර අම්මා කරන දේ මට තවත් බලාගෙන ඉන්න බෑ හැරී.." නොරීන් පැවසීය..

"ඔව් නොරීන්.. මං ගිහිල්ලා එයාලට ඕනේ කියලා හිතෙන දේවල් ටිකක් අරන් එන්නම්..ඔයා එයාලා එක්ක කතා කරන්න.."යි පැවසූ හැරී නැවත ඉක්මන් ගමනින් වෙළඳසැල වෙත පිවිසීය..නොරීන් ඔවුන් සිටි ප්‍රදේශයට කිට්ටු විය..කතා කිරීමට මගක් සොයා ගත්හ නොහැකි වූ නොරීන් මදක් උගුර පෑදීය..අර කාන්තාව හිස ඔසවා බැලීය..

" ඇයි නෝනා..මේවගේ තැනක..? "ඇය විමසීය..

" මේ..මන් ආවේ..ඔතන මොකද කුණු බාල්දිය අවුස්සන්නේ කියලා බලන්න..." නොරීන් පැවසිය...

" ඇයි නෝනා..එහෙම කිව්වේ.." ඇය යටහත් පහත් ව විමසිය.

" මේ.. ඔය ජරාව කන්න දෙන්න එපා ළමයට..මේ..ටිකක් ඉන්නකෝ ඔහොම....ඕගොල්ලෝ කොහෙද ඉන්නේ...? " නොරීන් විමසිය..

" අපිට ඉන්න තැනක් නෑ නෝනා..කඩේ වැහුවම පිලකට යනවා..." ඇය යටහත් පහත්ව පැවසීය.

" පවුලේ වෙන කවුද ඉන්නේ..? " නොරීන් විමසිය

" අපිට පවුලක් නෑ නෝනා..මගේ ළමයා තාම උගේ තාත්තා දැකලා වත් නෑ නෝනා.."ඉකිබිඳුමක් සමග කලකිරුණු ස්වභාවයකින් ඈය පැවසීය...

නොරීන් ඊට වඩා ඒ පිළිබඳ විමසීමට ගියේ නැත.

" ඉතින් ජීවත් වෙන්නේ..?" නොරීන් විමසිය..

" මං ජීවත් වෙන්නේ හිඟා කාලා නෝනා..දරුවාට බඩගිනි උනාම අතේ කීයක් වත් තිබුණොත් මොනවා හරි අරන් දෙනවා..නැත්තං මේ විදියට හොයා ගෙන කනවා..මන් කොහොමත් වේල් හත අටක් බඩගින්නෙ නෝනා..බඩගින්නෙ දැන් අපිට හුරු වෙලා නෝනා.." ඇය ඇඬූ කඳුළින් පැවසීය..

එවිටම වාගේ හැරී එතනට පැමිණියේය..ඔහුගේ අතේ බිස්කට්, වියළි මිදි, පලතුරු සහ තවත් ද්‍රව්‍ය සහිත බඩු මල්ලකුත් ඔවුන් ට සරිලන ඇඳුම් කීපයක් සහිත බෑගයකුත් විය.ඔවුන් දෙදෙනා එය ඉතාමත් සතුටින් එම දරුවාට සහ මාවත පරිත්‍යාග කළහ..එම ගැහැණිය ඒවා ගත්තේ මුහුණේ සිනා උතුරවමිනි..

" අනේ මේ නෝනයි මහත්තයයි මතු ආත්මේ බුදු වෙන්න ඕනේ..මේ කරපු පිනට..පුතේ..මේ නෝනටයි මහත්තයටයි වැඳපන්..." ඇය තම දරුවාට පැවසීය..

" හරි හරි..වඳින්න ඕනේ නෑ අපිට දැන් ටිකක් පරක්කු උනා..අපි යන්නම්.." කියූ ඔවුන් එතනින් පිට විය...

# 02 වැනි පරිච්ඡේදය.

වික්‍රමසිංහ යුවළ නිවසට පැමිණ සුළු මොහොතක් ගත වන විටදී ආගන්තුකයන් පැමිණියහ.

" Good Evening...එන්න ඇතුලට...වාඩිවෙන්න.."හැරී පැවසීය..

Good Evening..."ලෙස්ලිද පැවසීය.

" කෝ නොරීන්..." මානෙල් විමසිය.

"ම්ම්..නොරීන් පොඩි වැඩක්..ඉන්න මං එන්න කියන්නම්... වේලු....වේලු...."හැරී වැඩට සිටින කොළු ගැටයෙකුට අඬගැසිය..

" එනවා ලොකු මහත්තයා.."වෙළු දෙකට නැමිගෙන විත් කර තිබූ ලේන්සුව අතට ගත්තේය..

" වේලූ...නෝනා මහත්තයාටමං ටිකකට මෙහාට එන්න කිව්වා  කියන්න..

" හොඳමයි ලොකු මහත්තයා.." වේලු ඉක්මන් ගමනින් කුස්සිය දෙසට පිය නගන්නට විය..ස්වල්ප මොහොතකින් නොරීන් පැමිණියාය..

" ආ..ඔයාලා ආවද...?මට ඇහුනෙවත් නෑ..අපි මොනවා හරි බීලා ඉමු..අනේ.. මගේ චූටි බබලා දෙන්නා..කෝ..කෝ..එන්න ආන්ටි ළඟට.."නොරීන් නිවුන් දරු දෙදෙනා සුරතල් කරන්නට විය..

" සුමනා... මං ලෑස්ති කරපු රසකැවිලි පිඟානක් ඇති මේසේ උඩ..එකයි බොන්න මොනවා හරියි අරන් එන්න..."නොරීන් සේවිකාවකට පැවසීය.

කතා බහ අතරතුර කෙමෙන් රාත්‍රිය උදා වුණි.රාත්‍රී ආහාරය සඳහා වික්‍රමසිංහ යුවළත් සේරසිංහ යුවළත් කෑම මේසයට වාඩි වුණි..නොරීන් කුඩා දරුවන් දෙදෙනා සඳහා බත් පිගන් දෙකක් බෙදා දී පුළුන් කොට්ට තැබූ පුටු දෙකක වාඩි කරවීය..

" දැන් ආන්ටිගේ පාළුවට මෙහෙ නවතින්නේ කවුද...?" නොරීන් කුඩා දරුවන්ගෙන් විමසිය.

" මම " දෙදෙනාම එක හඬින් පැවසීය..

" දන්නවද නොරීන්... මං නොරීන් ආන්ටිලාගේ ගෙදර යනවා කිව්වාම මේ දෙන්නා වයින් කර වගේ වුණා.. " මානෙල් සිනාසෙමින් පැවසීය..

" ඕහ්..realy..ඒ කියන්නේ මගේ පැටවු දෙන්නා මට ආදරෙයිද...? "නොරීන් විමසිය.ඔවුන් දෙදෙනා එයට සිනා නැගිය..

" ඔයා දන්නේ නෑනේ මානෙල්..මන් අද හවස බඩු වගයක් ගේන්න ටවුන් එකට ගියා.."

" ඉතිං.. "

" අපි shop එකෙන් එලියට එද්දිම..පාරේ අයිනක තිබ්බ dust bin එකකින් අහක දාපු කෑම වගයක් අම්මා කෙනෙක් තමන්ගේ ළමයට කන්න දෙනවා...

" මට නිකන් කලන්තේ වගේ එක දැක්කම..ඊටපස්සේ.. හැරියි මායි ඒදෙන්නට කෑම ජාති ටිකකුයි ඇඳුම් වගයකුයි අරන් දීලා ආවා..." නොරීන් පැවසිය.

" ඇත්තටම මටත් ඒ වගේ දේවල් නම් බලන් ඉන්න බෑ.." මානෙල් පැවසීය.

" මං ඒ මනුස්සය එක්ක කතා කළේ ගෙදර වැඩක් හරි කරන්න එන්න කියලා.. පඩියක් දීලා ටිකක් සලකන්න..ඒ මනුස්සය කිව්වානේ අනේ ඒ ළමයාගේ තාත්තාව ඒ ළමයා තාම දැකලා නෑ කියලා..ඉතින් මට එපා වුණා.."නොරීන් පැවසීය.

"අම්මලා තාත්තලා ගේ වැරදි වලට ළමයි තමයි අන්තිමට දුක් විදින්න ඕනේ..." මානෙල් පැවසීය.

'' හ්ම්ම්ම්..''

" දැන් ඉතින් මේ ගෙදරත් එළිය කරන්න..බබෙක් හිටියා නම් හරි නේද හැරී... බාරයක් එහෙම උනේ නැද්ද...? "ලෙස්ලි විමසිය.

" බාරයක් නම් උනේ නෑ..එකත් කරලා බලන්න ඕනේ..ඇත්තටම හිතට හරි වාදයක් මේක.." හැරී පැවසීය..

# 03වන පරිච්ඡේදය

ඒ සඳුදාවේ වික්‍රමසිංහ යුවළ නුවර එළියේ පිහිටි හැරිගේ මහා ගෙදර වන වින්චැටෝ බංගලාව වෙත යමින් සිටියහ.ඉදිරිපස අසුනේ අසුන් ගෙන සිටි නොරීන් රෝස පැහැයට හුරු ගවුමක් හැඳ සිටියාය.සුදු පැහැයට හුරු සමක් ඇති ඇය ඉතාමත් අලංකාර ය.විවාහ වී අවුරුදු 06ක් ඉකුත් වුවත් ඇය තාමත් විසි හැවිරිදි යුවතියක් මෙනි.. හැරීද ඉතා කඩවසම් තරුණයෙකි.ඔහුටද වයස නොපෙනුනාට අවුරුදු 45 ක පුද්ගලයෙකි.

සීත මීදුම්, හරිත වනාන්තර කුරුලු ගීත අතරින් කාරය මාවත දිගේ ඉදිරියට ඇදෙන්නට විය.අඳුරට හුරු කොළ පැහැයක් ගත් ෆයිනස් වියන් අතරින් වංගු ගැසුණු මාවතේ ශේෂව තිබුණේ සීතල මුසු චමත්කාරයකි..වංගුවෙන් වංගුව ඉහළට ඇදෙන්න ඇදෙන්න ලස්සන වැඩිවුන නුවර එළි පාර නොරීන් ට නම් දැනුනේ ස්නේහවන්ත හරිත පාරාදීසයක් ලෙසිනි...එක් පසෙක තේ වතු යායකි.අනෙක් පසින් ඉමක් කොනක් නොපෙනෙන කඳු පන්ති ය.කහ,රතු, දම්, පාටින් වැසුණු මැයි මාර ගස් කඳු පන්ති අරක් ගෙන සිටියි

කොළඹ ඒකාකාරී බවින් මිදී නුවර එළි යන නොරීන් ට හැඟුණේ තමා නුවර එළි යන ප්‍රථම වතාව මෙය ලෙසයි.

කන්දක් වටේට ගිණි පෙට්ටි පෙළක් මෙන් පෙනෙන දුම්රියකි..සෙන්ට් ක්ලෙයාර් දිය ඇල්ල මනමාලියක් මෙනි..සුදු පැහැ සේද මෙන් වූ වළාකුළු අහසත් සමග එක්ව කඳු අතරින් ගලා බසින දිය ඇලි වලට අභියෝග කරන්නාක් මෙන් පෙනේ...

මේ නොරීන් හිඳින්නට ආසම පරිසරය බැවින් හැරී කාරය පාර අයිනේ තිබූ කඩ පිලක් අසල නැවැත්විය.

" ඇයි හැරී..? " මෙතෙක් වෙලා දැහැනකට සමවැදී සිට එය බිඳී ගියාක් මෙන් නොරීන් විමසිය.

" මං ටක් ගලා එන්නම්.." යැයි පැවසූ හැරී කාරයෙන් බැස කඩ පිලට ගොඩ විය.නැවත පැමිණෙන හැරීගේ අතේ ලුණු සහ මිරිස් දැමූ පලතුරු අච්චාරු බෑගයක් විය..ඔහුත් නොරීනුත් පරිසරයේ සුවඳ විඳිමින් අච්චාරු අනුභව කරන්නට විය.

තවත් හෝරාවකට පමණ පසු ඔවුන් වින්චැටෝ බංගලාව වෙත ළඟා විය.ඒ වන විටත් හැරීගෙ සොයුරිය වන ශැලි එහි පැමිණ සිටියාය.උණුසුම් පිළිගැනීමකින් ඔවුන් දෙදෙනා පිළිගත් හැරීගේ ආදරණීය මව ඔවුන්ට නොයෙක් දේවල් වලින් සංග්‍රහ කිරිය.සතුටු සාමිචියේ යෙදී සිටි යුවළ දිවා ආහාරයෙන් පසුව හැරීගේ මෑණියන් ද සමගින් දළදා මාලිගාව වැඳපුදා ගැනීමට ගියහ.

සවස් යාමය වෙද්දී ඔවුන් නැවත වින්චැටෝ බංගලාව වෙත පැමිණියේ පසුදින මිද්දෙනිය බලා යන අරමුණෙනි...ඒ වන විට හැරීගේ සොයුරිය වන ශැලී පිටව ගොස් තිබුණි..ඒ ගලින් තැනූ සුවිසල් මන්දිරයට ඇතුළු වුවද ඔවුන්ගේ ගත වෙවුලවමින් තිබූ සීතල පහව ගියේ නැත.

නමුත් ඒ සුවිසල් අලින්දයේ තිබුණු සෙල්මුවා ගිණි උඳුන තුළ දැවෙමින් තිබූ වියළි ෆයිනස් ගෙඩි සහ දර කොට ඔවුන්ගේ ගතට දැනුනු සිසිලස දුරු කර දැමීමට සමත් වුණි.

ඔවුන් දෙදෙනා එම බංගලාවේ ඔවුන්ටම වෙන්ව ඇති නිදන කාමරය තුළ ගිමන් හරින්නට විය.

" හැරී... ඔයාගෙයි මගෙයි කේන්දර කොපි දෙකක් අම්මා ළඟ තිබුණා නේද...? "නොරීන් විමසිය.

" ඔව් නොරීන්.. ඇයි..? "

" එක ඉල්ල ගන්නකෝ.."

" ඇයි..? "

" මිද්දෙනියේ ගියාම කේන්දර බලව ගන්න ඕනේ..."

"ම්ම්ම්... මම ඉල්ලා ගන්නම්..හරි මහන්සි නොරීන්..."

" මටත් එහෙමයි හැරී...අපි නිදා ගමුද..?Good Night..."

" Good Night..."

පසු දින උදෑසනම ඔවුන් මිද්දේනි යන්නට පිටත් වුණි.මේ යන්නේ ඔවුන් දෙදෙනාගේ දෛවය වෙනස් කරන ගමනක් බව ඔවුන් දෙදෙනා සීනෙකුදු නොසිතුවේය.

ගස් වැල් ක්‍රමක්‍රමයෙන් වියළි කලාපීය ස්වරූපයක් ගන්නට විය.ගමනට බොහෝ වේලා ගත වුණු නිසා වෙන්ඔවුන්ට දිවා ආහාරය මගදී ගන්නට සිදුවිය.මිද්දෙනියට ආ විගස ඔවුන් ගියේ වින්වැටෝ රෙස්ට් වෙතටය..එම බංගලාවේ වැඩි පුරම නවාතැන් ගෙන සිටියේ සුදු ජාතිකයෝය.ඔවුන්ද එහිතමා සඳහා සෑම දිනකම වෙන්ව ඇති කාමරය වෙත ගියහ.

ගමන් මහන්සිය නිවා ගත් ඔවුන් තේ වේල සඳහා වින්වැටෝ රෙස්ට්හි මැනේජර් වරයා ලෙස ඔවුන් පත් කර ඇති හැරීගේ ඥාති සොයුරා වන ෂෙල්ටන් දසහභාගි කර ගත්තෝය.. හැරී සහ ඔහු සමග ඉදිරි වැඩ පිළිවෙල කතා කරද්දී නොරීන් නිහඬවම ඇහුම්කන් දෙමින් තේ පානය කරන්නට විය.ඔවුන්ගේ කතා බහ අවසානයේදී නොරීන් ෂෙල්ටන් ඇමතීය.

" ෂෙල්ටන්.. මේ පැත්තේ නැද්ද ඔයා අඳුනන හොඳ කේන්දර බලන කෙනෙක් එහෙම...? "

" ඉන්නවා.. ඇයි අපේ එදිසිං උන්නැහේ.."

" ම්ම්ම් "

"මොකක්ද උවමනාව..? "

" නෑ මේ අපි දෙන්නගේ කේන්දර දෙක බලව ගන්න.."

# 04 වන පරිච්ඡේදය.

එදින සන්ධ්‍යාවේ ඔවුන් දෙදෙනා මිද්දෙනියේ ප්‍රසිද්ධ දෛවඥයෙකු වූ එදිසිං උන්නැහේ හමුවට ජන්මපත්‍ර දෙකද රැගෙන ෂෙල්ටන්ද සමග ගියෝය... එදිසිං උන්නැහේට වික්‍රමසිංහ යුවළ ආගන්තුක බැවින් ෂෙල්ටන් විසින් ඔවුන් එදිසිං උන්නැහේට අඳුන්වා දෙනු ලැබීය.

" ම්ම්ම්.. හොඳයි.. ගමු බලන්න මෙහාට කේන්දර දෙක.."එදිසිං උන්නැහේ පැවසීය..ප්‍රථමයෙන් හැරීගේ ජන්ම පත්‍රය අතට ගත් ඔහු දෙවනුව නොරීන්ගේ ජන්ම පත්‍රයද අතට ගත්තේය..දෙකම එක ළඟින් අතුරා ගත් ඔහු මොනවදෝ ඔහුටම කොඳුරා ගන්නට විය.

" හොඳයි...මේ ඇවිත් ඉන්නේ...දරු ඵල ප්‍රමදයක් ගැන දැන ගන්න නේද..? " එදිසිං උන්නැහේ විමසීය.

මුහුණට මුහුණ බලා ගත් යුවළ එය පිළිගත්හ.

" ම්ම්ම්...මේ කේන්ද්‍ර දෙකේ හැටියට...දරු ඵල ප්‍රමාදයක් නෙවෙයි වෙලා තියෙන්නේ...දරු ඵල නැති කම...කිව්වට අමනාප වෙන්ට කාරී නෑ අපේ මහත්තයෝ..මහත්තයාගේ තමයි දොසේ... වෛද්‍ය ප්‍රතිකාර එහෙම කරාද...? " එදිසිං උන්නැහේ විමසීය.

" ඔව්..අපි වෛද්‍ය ප්‍රතිකාර නම් කරා..ඒත් වැඩක් උනේ නෑ..." හැරී පැවසීය..

" ම්ම්ම්....එහෙමද...හොඳයි...මේ යුවළගේ අතමිට හරි සරුයි..දවසින් දවස දියුණු වෙනවා...මේ නෝනා වාසනාව මිටි කරන් උපන් තැනැත්තියක්...කොහොම උනත්...මහත්තයටයි නෝනාටයිම කියාල දරුවෙක් බලාපොරොත්තු වෙන්ට එපා...හැබැයි...කවදා හරි දවසක මොනයම් හෝ මාර්ගයකින් ඔය දෙන්නට දරුවෙක් ලැබෙනවා...අම්මේ තාත්තේ කියන උතුම් වචන දෙක අහන්ඩ පින තියෙනවා...එහෙම ලැබෙන දරුවා ගොඩක් දුරට ගැහැණු දරුවෙක්...යහපත් ළමෙක්...ඉතාමත් ලස්සනයි...මේ කේන්ද්‍ර දෙකේ හැටියට...තුන්දෙනෙක් සමග විදේශගතවීම් පෙන්නුම් කෙරෙනවා...

කොහොම උනත්...කිරි වෙහෙරට බාරයක් වෙනවා හොඳා..තමන්ට අම්මා තාත්තා යන උතුම් පදවි වලට හිමිකම් ලැබෙවා කියලා..පින් අතේ වැඩම කරන්ට...ඉගෙන ගන්න දරුවන්ට උපකාර කොරන්ට... හමුදුරුවරුන්ට සිව්පසයෙන් සංග්‍රහ කොරන්ට...උපස්ථාන කෝරන්ට.." යි ගුරුන්නාන්සේ පැවසිය...

ඔවුන් ගුරුන්නාන්සේට අදාල ගාස්තු ගෙවා නැවත වින්චැටෝ රෙස්ට් වෙත පැමිණියහ..

**************

( පසු දින උදෑසන.. )

පෙර දිනයේ දෛවඥයා පැවසූ දේවල් නිසා නොරීන් ගොඩක් කල්පනා කරමින් සිටින බව හැරීට දැනුණි.ඒ නිසා හැරී එදින උදෑසන නොරීන්ට මෙසේ පැවසීය..

" නොරීන්...ඔන්න මං ෂෙල්ටන් කිව්වා අපිට ඉස්තරම් ගමේ කෑම වේලක් ඕනේ කියලා...පාර්සල් හදලා දෙන්න කිව්වා වැව රවුමට ගෙනියන්න..."

" එකනම් හොඳයි හැරී...මන් සෑහෙන්න හිත කලබල කරන් ඉන්නේ..අපි හවස් වෙලා පන්සල් ගිහින් ලොකු හාමුදුරුවෝ හම්බ වෙමු....අනිද්දට එහෙම වුණොත් කිරිවෙහෙරට බාරයක් වෙනහැකිනේ..." නොරීන් පැවසීය...

" හ්ම්ම්... "

සැහැල්ලු ඇඳුම් වලින් සැරසුණු ඔවුන් දෙදෙනා කෑම පාර්සල් ද රැගෙන එළියට බැස්සහ..

හිරු ගෙන් සැදුණු ආලෝක කදම්බයක් තුරු ලතා අතරින් පොළවට පතිත වී තිබුණේ පරිසරය එකා ලෝක කරමිනි..මොනරුන්ගේ කල කල නාදය දස දෙසින් නින්නාද දෙන්නීය..

තවමත් වැවේ සමහර නෙළුම් පොහොට්ටු විකසිත වෙමින් පවතී...මී මැස්සන් සහ සමනලුන් ද එමටය..නෙළුම් මල් කඩන ඔරු කීපයක් වැවේ දිස් වෙයි...ගවයන් තැන තැන තණ උලා කති...මොවුන් දෙදෙනා සෙමෙන් සෙමෙන් ඉදිරියට යන්නට විය.

තැනක සිටි කොරවක්කන් දෙදෙනෙක් යුහුසුළුව පාරෙන් අනිත් පැත්තට දිවීය..තවත් තැනක සිටි කිරළෙක් ඔවුන්ගේ හඬට බිය වී ඉගිලී ගියේය..මේ සියල්ලන්ගෙන්ම දෙනුවන් පිනවා ගනිමින් ඔවුන් දෙදෙනා ඉදිරියට ගියහ... මද සුළඟක් හමා ගියේ කර්ශක බවක් පරිසරයට එක් කරමිනි...වැව් ඉවුර පතොක් සහ හම්බු පඳුරු වලින් ගහනය වී තිබුණි...තවත් ටික දුරක් යන විට කහ පැහැති සහ දම් පැහැති මායි මාර ගස් වදුලක් විය.එම ගස් යට කහ පැහැති සහ දම් පැහැති පලස් එලා ඇතිවාක් මෙන් පෙනුනි.එතනින් පිටු පසට වෙන්නට හම්බු පදුරු යායකි..

ඔවුන් එතනට ලං වන විට හම්බු පඳුරක සිටි සෙබඩෙකු පියඹා ගොස් මැයි මාර වදුලේ වැසිය...ගස සෙළවුණු නිසාවෙන් මැයි මාර මල් වැස්සක් මෙන් ඇද හැලුණි..නොරීන් එම ගස යටට දුව ගොස් වටයක් කැරකුනේ ඉතාමත් සතුටිනි... හැරීද නොරීන් ව සතුටින් තැබීමට ඉතා කැමතිය..එනිසාම ඔවුන් උදෑසන ආහාරය එම ගස යටදී ගැනීමට තීරණය කළහ..බෑගය බිම තබා ඔවුන් දෙදෙනා ද බිම වාඩි වුණි..කෑම පාර්සල් දෙක එලියට ගත් නොරීන් තවත් තරමක් විශාල පාර්සලයක් එළියට ගත්තාය..

" මේ මොනවාද. ? " නොරීන් විමසිය.

" බලන්න desert එක වෙන්න ඇති.. " හැරී පැවසීය..නොරීන් එතුලින් පැණි බෝතලයක්, හොඳින් වැසූ මී කිරි බඳුනක්, පැලුණු සීනි කැකිරි ගෙඩි කීපයක් සහ කෝලිකුට්ටු ඇවරියක් එළියට ගත්තාය." ආ...මට කෑම එක දීපු මනුස්සය කිව්වා පූවාලු ඇවරියකුත් ඇතිමහත්තයා කියලා.. මං ඒ මනුස්සය ගෙන් ඇහුවේ නෑ ඒ මොනවද කියලා..එහෙනම් මේ කෙසෙල් වලට වෙන්න ඇති..." හැරී පැවසීය...

උදේ ආහාරය සඳහා තිබුණේ කිරි බතුත් කට්ට සම්බෝලත් නෙළුම් අල ආච්චරුත් ය.

" අද සීතල ජාතිමයි කෑමට තියෙන්නේ..." නොරීන් පැවසීය..

" එකට කමක් නෑ නොරීන්... මේ පැත්ත ගොඩක් රස්නෙයි නේ..." හැරී පැවසී

# 05 වන පරිච්ඡේදය.

සුදු පැහැ දිග සායකින් සහ සුදු බ්ලවුසයකින් සැරසී කොන්ඩය පිටුපසට කර බුලක් දමා මල් වට්ටියක් අතින් ගත් නොරීන් සහ සුදු දිග කලිසමක් සුදු කමිසයක් යනාදියෙන් සැරසී ගිලන්පස බඳුනක් අතින් ගත් හැරීත් පන්සල් යාමට පිටත් වුණි.සුදු වතින් සැරසුණු නොරීන් වෙනදාට වඩා පින් පාටට පෙනුනි.

පන්සලට පැමිණි ඔවුන්ගේ සිත දැහැන් ගත වූවක් මෙන් වුණි...ඒ තරම්ම පරිසරය නිස්කලංකය... නිහඬය... ඔවුන් දෙදෙනා බුදුන් වැඳ ආවාස ගෙය වෙත පිය නැගිය..අනතුරුව ලොකු හාමුදුරුවෝ බැහැ දැක රැගෙන ආ දැහැත් ගිලන්පස පූජා කර සුව දුක් විමසිය..

" ඔය ඇත්තෝ... ආවේ විසේස කරණාවකටෙයි...? " ලොකු හාමුදුරුවෝ විමසීය..

" එහෙමයි අපේ හාමුදුරුවනේ.... " යුවළ පැවසීය..

ලොකු හාමුදුරුවන්ගේ අවසර ලත් යුවළ දෛවඥයා පැවසූ සියල්ල ලොකු හාමුදුරුවන්ට පැවසීය...


"ම්ම්ම්...දැන්..කාරණේ වෙලා තියෙන්නේ.... ඔය ඇත්තන්ට..කල යුතු දේ ගැන උපදෙස් ගැනීම...? " ලොකු හාමුදුරුවෝ විමසීය...

" එහෙමයි අපේ හාමුදුරුවනේ... "

" හොඳයි... එදිසිං උන්නැහේ කියලා තියෙන්නේ... ළමයෙක් හදා ගන්ඩ ගන්නවා වගේ දෙයක්..."

" අනේ හාමුදුරුවනේ...අපිට ඒ දේට උදව් කරන්න...’’

" ඒ කොහොමද අපේ මහත්තයෝ..." ලොකුහමුදුරුවෝ විමසිය.



" අපෙ හාමුදුරුවනේ...දුප්පත් තැනක උනාට කමක් නෑ... ශිෂ්ඨ සම්පන්න අම්මෙක් තාත්තෙක් ගේ දරුවෙක් හොයා දෙන්න...ළමයා ටිකක් පොඩි උනොත් හොඳයි..." හැරී පැවසීය.

" ම්ම්ම්...මන් දන්න තැන් නම්...දෙකක් තියෙනවා.. එක තැනක් නම්.. හුගාක් දුර බැහැර...පනාමුරේ... ඒ අම්මට නම් දරුවා දෙන්න කෙනෙක් හොයන්නෙ... මොකොද...ඒ දරුවා... පවුලේ නම්බුවට ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ...ඒ කටයුත්ත නම්..ඉක්මනට කර ගතෑකි..ප්‍රශ්නේ තියෙන්නේ... නීත්‍යානුකූල කසාදයකින් බිහිවෙච්චි දරුවෙක් නෙවි...දරුවාගේ අප්පොච්චා කැමති නැල්ලු..උප්පැන්නේට නම වත් දෙන්ට..ඒ ඇත්තෝ නම් බෝම වංසක්කාරයෝ... අලි ඇතුන් පවා ඉන්ටවා..." ලොකු හාමුදුරුවෝ පැවසීය.

" අනේ අපෙ හාමුදුරුවනේ...අම්මා තාත්තා දෙන්නම ඉන්න ළමෙක් වෙන්නඕනේ..නැත්තං ලොකු වෙද්දි ඒ ආරෙට යන්න යනවා..." හැරී පැවසීය.

" එකත් හැබෑ තමා...ඉන්ට බලන්ට...ම්ම්ම්ම්...ආ..තව පවුලක් ඉන්නවා...ඒ අය නම් මේ මිද්දෙනියෙම තමා...හැබෑ හරි දුප්පත්...අප්පොච්චා පොල් ගෙඩියක් ඔළුවට පත බැවිලා මලා...දැන් මාස පහකට වැඩි...ගෙදර අය ඔය මල්..දිවුල්..ඕවා මේවා විකුණලා ජීවත් වෙන්නේ..පවුලේ ළමයි 06 හය දෙනෙක් හිටියා...පොඩිම එකීට තාම මයේ හිතේ...ම්ම්ම්....අවුරුද්දක් වගේ ඇති...හැබෑ තව ළමයෙක් නම්...දෙයි කියලා හිතන්ට අමාරුයි අපෙ මහත්තයෝ....මොකෝ..මේඅපේ....පොඩි නම..ගිහි කාලේ ඒ පවුලේ දෙවැනියා...ළමයෙක් සාශනේටත් පූජා කොරල..මහත්තෙලටත් දෙයි කියලා නම්....හිතන්ට අමාරුයි... කෝම උනත් ඔය ඇත්තෝ කැමති නම්... මං පොඩි නමත් එක්කන් දොඩල බලලා...ම්ම්ම්...වැඩේ එකලාසයක් කොර ගන්ට බලන්නම්..." හාමුදුරුවෝ පැවසීය..

" හොඳමයි අපේ හාමුදුරුවනේ...අනේ බොහොම පිං හාමුදුරුවනේ.."

යුවළ කොට නැවත වින්චැටෝ බලා පිටත් වූහ..ඒ වන විට හවස තේ වේලාවද පසුව තිබුණි.

හිරු අපරදිග අහසේ බැස යමින් තිබුණේ රත් පැහැ ගැන්වුණු එලයක් ලෙසිනි.සුළඟට ඉරී කීතු වී ගිය කෙසෙල් කොළ හමන්නා වූ සුළඟට මද හඬක් නගමින් සෙළවෙයි.

උදේ පාන්දරම තණ කැවීමට දක්කා ගෙන ආ හරක් රංචුවක් දක්කා ගෙන යන අඟුරු පැහැති කොළු ගැටයෙකි...පාසල් නිල ඇඳුමට අයත් වූ නිල් පැහැති කොට කලිසමකින් සැරසී සිටින ඔහුගේ එක් අතක තරමක් දිගු කෝටුවකි...

වැවට ඈතින් බැස යන හිරුගේ එළිය වැටුණු වැව් දිය රත් පැහැ සහ තැඹිලි පැහැයකුත් දම් පැහැ සහ රෝස පැහැයකුත් කලවම් පැහැයක් ගෙන තිබුණි.තවත් ඉදිරියේදී ඔවුන්ට දර මිටියක් හිස තබා ගෙන පලා මිටක් අතින් ගෙන දිය පිරුණු කළයක් ගෙන යන ගැමි කතක්ද, බට්ටෝ වැල් ( වැව් මාලුන් විශේෂයක් අමුණා තැනූ වැල් ) කීපයක් අතින් ගෙන ඇයත් සමගම යන කොළු ගැටයෙකුද දක්නට ලැබුණි.අහසේ v හැඩයට පියඹා යන කුරුලු රැන්ය.අද සැන්දෑ අහස සාදයකට සූදානම්ව වැනිය..තවත් ටික දුරක් යද්දී ඔවුන්ට තවලමක ගොස් ගොම්මන් වැටුණු පසු නවාතැන් ගැනීමට තැනක් සොයන ගොන් කරත්ත පෙළක් හමු වුණි..ඔවුන්දෙදෙනාද රෑ බෝවන බැවින් ඉක්මන් ගමනින් වින්චැටෝ රෙස්ට් වෙත පැමිණියහ....



# 06 වන පරිච්ඡේදය

එදින උදෑසනම සුදු වතින් සැරසුණු යුවළ කතරගම බලා පිටත් වූයේ හිතේ බලාපොරොත්තු පොදි බැදන් ය.කිරිවෙහෙර බලා යන ගමන අතරමගදී ඔවුන්ගේ මෝටර් රථයේ එන්ජිම උණුසුම් වී වතුර දමා එයසිසිල් වන තෙක් සිට යාමට සිදුවූ නිසා ගමනට මදක් වැඩිපුර කාලය ගතවිය. කිරි වෙහෙර වෙත ගිය ඔවුන් එක් මල් කඩයකින් සුදු නෙළුම් මල් වට්ටියකුත් රතු නෙළුම් මල් වට්ටියකුත් මානෙල් ඕලු ආදී මල් පොකුරු කීපයකුත් මිල දී ගත්හ..නෙළුම් මල්ද රැගෙන කිරි වෙහෙර දෙස ගිය ඔවුන්..ඒ නෙලුම් මල් මිල දී ගැනීම ඔවුන්ගේ දෛවයේ වාසනාවන්ත සන්ධිස්ථානයක් බව සීනෙකුදු නොසිතූහ...මල් පූජා කර ඔවුන් තමන්ට මවක් පියෙක් ලෙස වරම් ලැබුනහොත් කිරිපිඩු පූජාවක් සහ නෙළුම්, ඕලු, මානෙල් සහ කුමුදු මලින් වට්ටි හතක් බැගින් පූජා කරන බවට සුදු රෙදි කඩක කාසියක් ගැට ගාසා බාර විය..

සිතේ සැහැල්ලුවෙන් සහ සතුටින් ඔවුන් අනෙකුත් ස්ථානද වැඳ පුදා ගත්හ..නැවත කාරයට ඒමට පිටත් වූ ඔවුන් තමන් මිල දී ගන්නා ලද මල් වට්ටිවල වට්ටි එම කඩයට බාර දීමට ගියහ..එම කඩයට ලං වන විටම ඔවුන්ට ඇසුනේ කුඩා දරුවෙකු කෑ ගසන හඬකි.ඉක්මන් ගමනින් එතනට ගිය යුවළ දුටුවේ හද සාසලවන සුළු දසුනකි.බිම දමන ලද පැදුරු කඩක නිදා සිටින අවුරුද්දක පමණ වයසැති දැරියකි.දැලි වැකී කිලුටු වී ගිය කුඩා කලිසමක් පමණක් ඇය හැඳ සිටියාය.ඉතාමත් පැහැපත් වූ දැරිය එම කලිසම නිසා තවත් පැහැපත්ව පෙනෙයි..ඉතාමත් කාරුණික සහ අනුකම්පා සහගත වූ නොරීන් එහි සිටි වෙලෙන්දිය ඇමතීය.

" අනේ ඇයි මේ දරුවා අඬන්නේ..." නොරීන් ලෙන්ගතුව විමසිය...

මදක් නිහඬව සිටි කාන්තාව බිම බලා ගෙන,

" බඩගිනි වෙලා නෝනා...යැයි පැවසීය.



" ඉතින්....නොරීන් ඇසීමට ගිය දේ ගිල ගත්තේ අණ්ඩ දමා මසන ලද ඇයගේ චිත්තයත් සැට්ටයත් දුටු බැවිනි.ඒ චිත්තයේ නොමැසූ තැනක් නැති ගණන්ය...

" අනේ නෝනා මට ළමයට කන්න දෙන්න දෙයක් නෑ නෝනා..." ඉතින් යැයි ඇසුවේ ඇයි දැයි වැටහුණු ඇය පැවසීය.

" හැරී පිටි ටින් එකකුයි කෑම බීම ටිකකුයි අරන් එනවද...? මං මෙයාලා ගැන හොයල බලන්නම්...." කාන්තාවට නැසෙන දුරකට හැරීව රැගෙන ගිය නොරීන් පැවසීය..හැරීට ඇයගේ යටි අරමුණ පැහැදිලිවම තේරුණි...ඒ නිසාම ඔහු එයට එකඟ විය..හැරී පිටත් වූ පසු ඇය නැවත කඩයට ගියාය..

" ඕගොලෝ කොහෙද..? "

" අපි මිද්දේණියෙ බුදු නෝනා..."

" මේ දරුවාගේ තාත්තා...?

" නෝනා හරි.. කරුණාවන්තයි...අපේ දුක් අහන්ට කවුරුත් නෑ නොනේ..මුන්ලගේ අප්පා පොල් ගෙඩියක් ඔළුවට වැටිලා මලා නෝනා..අපි ජීවත් වෙන්නේ මල් විකුණලා නෝනා..මායි මේ ළමයයි මේ ළමයාගේ ඊළඟ අයියයි තමා නෝනා මල් විකුනන්වේ...ඊළඟ කෙල්ලෝ දෙන්නම ඉස්කෝලෙ නම් යනවා...උන් දෙන්නට ඉගෙනීම වතුර වගේ වුණාට මට උන්ට උගන්නන්ට තරම් අතේ කාසි නෑ නෝනා...

උනුත් ඉතින් ඉස්කෝලෙ අහවර උනාම පොල් කොළ සුද්ද කරලා ඉරටු ගන්නවා ආත්තම්මත් එක්කලා..ලොකු කොලුවත් එක්ක වැවේ මලුත් කඩනවා නෝනා...දිවුල් අරව මේවාත් අහුලනවා..අපේ ලොකු කෙලීට වැඩිය ඩිංගිත්තක් වැඩිමල් කොළුවෙක් හිටියා.. මං ඒ ළමයාව පන්සලට පූජා කොරා නෝනා..ලොකු කොලුවා බඩු ලොරිවල නැගීලා ඇවිත් මට මල් දීලා යනවා පොඩි කොලුවත් එක්ක..ඊට පස්සේ දිවුල්, මල් වගේ ජාති මුල්කිරිගල විහාරේ ළඟට ගෙනිහින් විකුණනවා නෝනා...ආයේ ඔයා මොනවා හරි ටිකක් එක්කාසු කොරන් අඟුණකොලපැලැස්සේ පොලට ගෙනිහින් විකුණනවා...

මගේ දරු පැටව් ඉන්නේ ආත්තම්මා ගාව තනියෙන්.. මං අම්මෙක් කියලා උන් එක්ක ඉන්ට වත් වෙලාවක් නෑ බුදු නෝනා..." යී ඇය හැඩූ කඳුළින් තම කතාව පැවසීය..

" දැන් මේ ළමයාගේ තාත්තා නැති වෙලා කොච්චර කල්වෙනවද...? "

" දැන් මාස 9 ක් විතර වෙනවා නෝනා..."

ඒත් සමගම වාගේ හැරී එතනට පැමිණියේය...

" මෙන්න..මේකේ පිටි කිරි ටින් එකක් ඇති..තව කෑම බීමත් ඇති..මේකත් තියා ගන්න කියමින් බඩු මල්ලද සමග රුපියල් සියේ නොට්ටුවක් ඇය අතට දුනි

" අනේ නොනටයි මහත්තයටයි උපනුපන් ජාති ජාතිත් බුදු බව ලැබෙන්ට ඕනි.. මේ කර ගත්ත පිනට.." කියමින් ඇය දෑසින් වැටෙන කඳුළු අත්ලින් පිහදා ගත්තාය...

" ආ..මේ ළමයාගේ නම...? " නෝරින් අමතක වූ ලෙසින් විමසිය.

" කුසුමා...නෝනා.."

" ඔයාගේ නමයි..මේ ළමයාගේ තාත්තාගේ නමයි...? "

" මගේ නම පුංචි මැණිකා.... මුන්ලෑ අප්පොච්ච ගුණදේව..නෝනා.."

" අපි එහෙනම් ගිහින් එන්නම්..මේ ළමයට මොනවා හරි කන්න දෙන්න.."

" හොඳමයි නෝනා..'

# 07 වන පරිච්ඡේදය.

" මට හරි ප්‍රශ්නයක් හැරී...අපේ ලොකු හාමුදුරුවෝ කියපුවයි..මේ ගැනු කෙනා කියාපුවයි එකට එක ගැලපෙනවා වගේ.." කියූ නොරීන් සම්පූර්ණ විස්තරය ඔහුට පැවසීය.


" මං කියන්නද නොරීන්..අපි..පන්සලට ගිහින් ලොකු හාමුදුරුවොත් එක්ක මේ ගැන කතා කරමු..." හැරී පැවසීය.

" ම්ම්ම්...ඔව් හැරී..."

කිරි වෙහෙරේ සිට වින්චැටෝ රෙස්ට් දක්වා ඔවුන් ගමන් ගත්තේ කල්පනා ලෝකයන්හි ගිලෙමින් ය. ඉඳ හිට හුවමාරු වූ වදනකින් මිස ඔවුන්ගේ නිහඬතාව පළුදු වූයේ එන්ජිමේ ශබ්දයෙන් පමණි.

එදිනද සවස් යාමයේ පන්සල වෙත ගිය ඔවුහු ලොකු හාමුදුරුවෝ බැහැ දැක එම සිද්ධිය විස්තර කෙරීය..

ප්‍රශ්නය යම්තාක් දුරට නිරවුල් කර ගත් ඔවුන් පන්සලේ උඩ මළුවට ගියේ බුදුරජාණන් වහන්සේ වැඳ පුදා ගැනීමටය..ඔවුන් වැඳ පුදා ගෙන අවසන් වී ආපසු ඒමට සූදානම් විය.එවිටම වාගේ ඔවුන් දුටුවේ උඩ මළුවේ බණ මඩුවේ වහලය කඩා වැටී ඇති බවය..නැවත ලොකු හාමුදුරුවන් හමු වීමට ගිය ඔවුන් එය සෑදීමට පොරොන්දු විය. ඒ වින්චැටෝ රෙස්ට්හි මුල් අයිතිකරුවන්ට පින් පිණිසය..වින්චැටෝ රෙස්ට් යනු විශාල බංගලාවකි..එය හැරීගේ බාප්පාට සහ පුංචි අම්මාට අයිති වූවකි..ඔවුන් එය විකුණන අදහසකි සිටියත් ඊට පෙර හමුදාවේ සේවය කර ඔවුන්ගේ එකම පුතුද යුධ කටයුතු වලට ගොස් මිය ගියේය.එබැවින් ඔවුන් තම බංගලාව හැරීට පවරා දී තම සෑදෑ සමය ඔවුන්ගේ සරණින් ගත කර කාලක්‍රියා කළහ..මේ තිදෙනාට පින් පිණිස වහලය සෑදවීමට මොවුන් දෙදෙනා තීරණය කළහ.



ඔවුන් එදින විඩාව අධික නිසාවෙන්ම ඉක්මනින් රාත්‍රී ආහාරය ගෙන නින්දට ගියහ.එහෙත් ඔවුන් වෙත නිදි දෙව් දුව පැමිණියේ නැත.අවසානයේදී නොරීන් වැව දෙස මූණ ලා තිබූ ඔවුන්ගේ කාමරයේ ජනේලය ඇර එතනින් සිට ගත්තාය..හැරී ඇයට අනෙක් පසින් සිට ගත්තේය..වැවේ ඈත කොන්වල තැනින් තැන ගිණි එළි පෙනෙයි... හූ හඬවල් ඇසෙයි...සීපද කියනා හඬ ඇසෙයි..වැවේ කෙළවරවල් වල තනා ගත් පැල් ඇති ගොවියෝ ලන්තෑරුම් සහ ගිණි මැල පත්තු කරගෙන පැල් රකිනා විට කියන හූ හඬ සහ සී පදයි ඒ ඇසෙන්නේ..

මදක් වෙලා ජනේලය අසල සිටිඔවුන් දෙදෙනා නැවත නින්දට ගියෝය..

*********

( තෙදිනකට පසු... )

ලොකු හාමුදුරුවෝ ඔවුන්ට පන්සල ට පැමිණෙන්න යැයි පැවසුවේ පුංචි මැණිකා හා කතා බස් කිරීමට ඉඩ හසර ලබා දීමටයි.උදෑසන ආහාරය වේලාසනින් ගෙන පන්සල බලා ගිය ඔවුන් හට ලොකු හාමුදුරුවන් අසල බිම වාඩි වී සිටි පුංචි මැණිකා සහ කුසුමා දක්නට ලැබුණි." මේඉන්න නෝනයි...මහත්තයයි...අඳුනනවා ඇතිනේ...? " ලොකු හාමුදුරුවෝ වික්‍රමසිංහ යුවළ දක්වමින් පුංචි මැණිකාගෙන් විමසිය...

" එහෙයි අපේ හාමුදරුවනේ..."

" දැන්... මං කිව්ව කාරණය ගැන.....පුංචි මැණිකා හිතල බැලුවැයි...? "

" එහෙයි අපේ හාමුදුරුවනේ..."

" මොකක්ද පුංචි මැණිකාගේ තීරණය...? "

ඇය නිරුත්තර විය.

" ඈ පුංචි මැණික...?"

" මට...තාම හිතාගන්න අමාරුයි..අපේ හාමුදුරුවනේ.."

" ඒ කියන්නේ... පුංචි මැණික මනාප නෑ..ටිකක් දියුණු වෙලා...කුසුමා ලස්සනට ඉන්නවා බලලා..අනෙක් ළමයින්ටත් උගන්න ගන්ට... මොකොද..මේ නෝනලා මහත්තෙල ගැන මං...හොඳ..ට.. දන්නවා...මේ මහත්තෙලා...කුසුමාවත් අරන්..ඕනෑ විදියකට හිටපියවුල කියලා...ගමෙන් යන්ටෙ නෑ...ඔහෙලට උදවු කරනවා..එහෙම නේද අපේ මහත්තයෝ...?"

" එහෙමයි අපේ හාමුදුරුවනේ.."


මදක් නිරුත්තරව සිටි පුංචි මැණිකා...

" අපෙ හාමුදුරුවනේ...මට..ඩිංගිත්තක් අපේ පොඩි නමත් එක්ක කතා කරන්ට දෙනවද...? "

" හා හොඳයි...ඉන්ට මන් කතා කොරන්ට.." යි ලොකු හාමුදුරුවෝ පැවසීය..

පොඩි හාමුදුරුවන් සමග කතා බස් කර පසු පුංචි මැණිකා මෙසේ පැවසීය..

"අපේ හාමුදුරුවනේ...නෝනා..මහත්තයා... මං...මනාපයි..කුසුමලාගේ ආත්තම්මා එක්කත් දොඩලා පයින්ඩයක් දෙන්නම්...මේ දෙන්නේ..හිතකින් නේවි..මගේ කෙලීට යහපතක් වෙනවා බලන්ට...



# 08 වන පරිච්ඡේදය.

කුසුමාව දරු තනතුරට ගැනීමට පුංචි මැණිකාගේ කැමැත්ත ගත් වික්‍රමසිංහ යුවළ ඔවුන්ට පිළිවෙලක් වීම සඳහා යම් මුදලක් දී කොළඹ බලා ගියේ නැවත සතියකට පසු මිද්දෙනියට පැමිණෙන අදහසිනි..කොළඹ ගිය විගස ඔවුන් මේ පිළිබඳ හැරිගේත් නොරීන්ගේත් දෙමාපියන්ට දැනුම් දුනි.ඔවුන්ගේ ආශීර්වාදයද නොමදව ලැබුණි...

" නොරීන්..ඔයා room එක decorate කරන්න ඉන්නේ කොහොමද...? " හැරී විමසීය.

" ම්ම්ම්...අපේ room එකට...light pink colourඑකක් ගාමු..තව..බබාට cot එකක් ගන්නත් ඕනේ...අපේ ඇඳට දාන bedsheets and pillow covers pink colourඑකට change කරන්න ඕනි...ආ..බබාට ඇඳුම් ගන්නත් ඕනේ.." නොරීන් දෑස් බලාපොරොත්තු වලින් පුරවා ගෙන සතුටින් ඉපිලෙමින් පැවසීය...

" ඔයා බබාට කුසුමා කියන නමම තියනවා.. ද..? " හැරී විමසිය

" නෑ..නෑ.. නොරීන් පැවසිය.

" එහෙනම්...මොකක්ද..English නමක් ද...? " හැරී විමසිය..

" ම්ම්හ්..ටිකක් හිතලා බලමු.." නොරීන් පැවසීය.

" ම්ම්ම්.. මට..මෙහෙමත් හිතෙනවා හැරී..දැන් පුංචි මැණිකා කියන්නේ මට..මගේ අක්ක කෙනෙක්ට සම වෙන්න යන කෙනෙක්නේ...ඒ ගොල්ලෝ..අපිට මේ කරපු උදව්වම ගොඩාක් වටිනවා නේ..අපිට බබාගේ නම ඇහුනම..අතීතය මතක් වෙන තරමට හොඳයි නේද...? නොරීන් විමසිය.

" ම්ම්ම්..ඉතින් ඔයා කියන්න යන්නේ මොකක්ද..? " හැරී විමසිය...

" මං කියන්න යන්නේද..?අපි බබාට සුගන්ධිතා කියලා නම තියමු..මොකද සුගන්ධිත කියන්නේ නෙළුම් මලට..එදා අපි ගත්ත නෙළුම් මල් වට්ටි තමයි..අපේ ජීවිතේ වෙනස් කරේ..

එක නිසයි මං එහෙම කිව්වේ..ඊට වඩා හොඳ නමක් ඔයාට හිතෙනවා නම් අපි ගැලපෙන එකක් තියමු..." නොරීන් පිළිතුර දැන ගැනීමට අවශ්‍ය යැයි හැඟවෙන පරිදි බැල්මකින් නෙතු සරසා ගෙන හැරී දෙස බැලිය.

" ඇත්තටම නොරීන්..ඒ නම නම් ගැලපෙනවා...මට ඔහොම හිතෙන්නේ නැනේ..වෙලාවකට හිතෙනවා ඔයාගේ මොලේ හොරකම් කරන්න..ඒත් ඉතින් වැඩක් නැනේ..මට තිබ්බත් එකයි..ඔයාට තිබ්බත් එකයි නේ.." හැරී විහිළුවක් කළේ කාලයකට පසුය.. සුගන්ධිතා නෙළුම් මලක් හා සම වන සේ ඔවුන්ගේ දිවිය සුවඳවත් කර , අලංකාර කර ඇති නිසා හැරී සිටින්නේ සිතේ කලකට පසු ඇති වූ විශාල සොම්නසකිනි...නොරීන්ගේ සිතේ ද සතුට වැහෙන්නිය..

ඔවුන් දෙදෙනා සතියක් ඇතුලත කාමරය පිළියෙල කර මිද්දෙනි යාමට සූදානම් වූයේ හැරිගෙත් නොරීන්ගේත් මව් පියන්ටත්,සේරසිංහ යුවළ ඇතුළු ළඟම හිතවතුන් කීපදෙනෙකුටත් දරුවා ගෙදරට ගෙනෙන දවසට ඇති සාදයට අරධනාද කරමිනි.

නැවත මිද්දෙනියට පැමිණි ඔවුන් වින්චැටෝ රෙස්ට් හි නවාතැන් ගත්හ..මේ වන විටද පුංචි මැණිකා තමාගේ ජීවන රටාව අත් හැර නොමැත.වික්‍රමසිංහ යුවළගේ උදව්වෙන් කුසුමාගේ වැඩිමල් ම සොයුරා අත් ට්‍රැක්ටරයක් මිල දී ගත්තේය.දැන් ඔහු අඟුණුකොළපැලැස්ස සති පොලේ සුළු වෙළෙන්දෙක් ය.

රෙජිස්ටර් වරයා, ගම්මුලාදෑනියා සහ පන්සලේ ලොකු හාමුදුරුවන් ඉදිරියේදී කුසුමාව සුගන්ධිතා වික්‍රමසිංහ නමින් නම් වෙනස් කර වික්‍රමසිංහ යුවළගේ බූදලයෙන් හරි අඩක් ඇයට අයිති වන සේ ලියා පුංචි මැණිකාගෙන් වික්‍රමසිංහ යුවළට කුසුමා නොහොත් සුගන්ධිතා පවරා දෙනු ලැබුණි.පුංචි මැණිකා නම් ඒ අවස්ථාවේ හැඬු කඳුළින් පසු විය.

" පුංචි මැණිකා.."නොරීන් මෘදු ස්වරයෙන් ඇමතීය.

" ඔයා පොඩ්ඩක් වත් බය වෙන්න එපා..අපි දරුවාට හොඳට සළකනවා..ඒ වගේම දරුවාගේ සහෝදර සහෝදරියන්ටත්.." නොරීන් ඇයව සොයුරියක සේ සලකා හිත හැදෙන අයුරින් පැවසීය.

" අනේ නෝනා.. මං ඒවුනාට අම්මෙක් නෙව..මට හරි ආසයි මගේ දරුවා ලොකු වෙනවා බලන්ට.." පුංචි මැණිකා පැවසීය..

දරුවා ඇයට නැවත දක්නට නොලැබේ යැයි ඇයගේ සිත තුළ පැලපැදියම් ව ඇති වග නොරීන්ට වැටහිණි.

" අනේ පුංචි මැණිකා..අපි ළමයාව හංගන්නේ නෑ..ඔයාට ළමයාව දකින්න පුළුවන්..." නොරීන් පැවසීය.

එම කටයුතු නිම වීමෙන් පසු වික්‍රමසිංහ යුවළ සති තුනක් පමණ මිද්දෙනියේ නැවතී සිටීමට කටයුතු කළහ.ඒ කාලය ඇතුලත සුගන්ධිතාගේ අක්කලා දෙන්නාත් කුඩා අයියාත් පාසල් අධ්‍යාපනය ලබා ගැනීමට මිද්දෙනිය ආසන්න වීරකැටිය ප්‍රදේශයේ පිහිටි උසස් පාසලකට ඇතුළත් කිරීම වික්‍රමසිංහ යුවළ අතින් සිදු විය.

ඉන් පසුව පැල්පතක් ලෙස පැවති ඔවුන්ගේ නිවස වික්‍රමසිංහ යුවළ විසින් සාමාන්‍ය නිවසක් ලෙස තනා දෙන ලදී.තවද පන්සලේ බණ මඩුවේ වහලය ද පිළිසකර කිරීම ඔවුන් අතින් සිදු විය.

දැන් සුගන්ධිතාගේ පවුලේ අයද සැපවත් ජීවිත ගත කරති.සති තුනකින් ඔවුන් කොළඹ යන විට සුගන්ධිතාගෙ පවුලේ අයද නැවතමිද්දෙනි පැමිණි විටදින දෙකකට පමණ කොළඹ රැගෙන යාමට පොරොන්දු විය.

වික්‍රමසිංහ යුවළ සුගන්ධිතාද සමග නැවත කොළඹ ගියහ.එදිනට පසු දා උදෑසන කුඩා සාදයක් සූදානම් කර තිබුණි..මේ වන විටද හැරීගේ සහ නොරීන් ගේ දෙමාපියන් කොළඹ බංගලාව වෙත පැමිණ තිබුණි.පසු දින සුගන්ධිතා රෝස පැහැති අලංකාර ඇඳුමකින් සැරසී සිටියාය...නොරීන් සහ හැරී ද කවදාවත් නැති ලෙස තරුණව පෙනුණි.

විශාල කේක් ගෙඩියක් කපා සතුට සැමරූ ඔවුන් ඉතාමත් ඉහළ මට්ටමේ ආහාර පානයන්ගෙන් ඥාති මිත්‍රාදීන්ට සංග්‍රහ කළහ.එදින සතුටින් සැමරූ ඔවුන් නව දිවියකට අඩිතාලම් තැබිය..

# 09 වන පරිච්ඡේදය.

( අවුරුද්දකට පමණ පසු.. )

මේ වන විට සුගන්ධිතා හැරී සහ නොරීන් අතරට විත් අවුරුද්දක් පසු වී ඇත.හෙට දිනයේදී ඇයට අවුරුදු දෙකට ලබයි.හැරී සහ නොරීන් ඒ සඳහා හෙට දිනයේ ඇයව රැගෙන කැලණි පන්සල් යාමට තීරණය කරගෙන සිටී.එදින රාත්‍රියේ සිටම ඔවුන්ගේ ගෙදර මෙහෙකරුවන් අතින් විවිධාකාරයේ ආහාර සැකසෙයි.ඒ හෙට දින කැලණි පන්සල වැඳ පුදා ගැනීමට පැමිණෙන අයට සහ නැති බැරි අයට ආහාර වේලක් ලබා දීමටය.ඔවුන් කුඩා ළමුන් සදහා ලබා දීමට කැවිලි පාර්සල් ද සූදානම් කර ඇත.සුගන්ධිතාට දැන් යන්තමින් බහ තේරීමට සහ ඇවිදීමට හැක.ඇය දකින කාගේත් ආදරය දිනා ගනී. සුගන්ධිතා ඉතාමත් කඩිසර ලෙස මේ සිදු වන දේවල් බලමින් නොරීන් සමග ගේ තුළ ඇවිදින්නීය.

පසුදා උදෑසනම පිබිදි නොරීන්, හැරී සහ සුගන්ධිතා ත්, බංගලාවේ සේවක සේවිකාවනුත් කැළණි පන්සල බලා පිටත් වූහ. වික්‍රමසිංහ පවුල රැගත් කාරයට පිටුපසින් සේවක සේවිකාවන් සහ ආහාර රැගත් ලොරි රථයක් පැමිණෙයි.නොරීන් ගේ සහ හැරී ගේ දෙමාපියන් ද කැලණි පන්සල වෙත පැමිණීමට නියමිත ය.සේරසිංහ යුවළ ද මගදී ගමනට එකතු විය.

කැළණි පන්සල අසල අසල විශාල සෙනඟක් නිතරම පාහේ රැස් වන්නේය.අදද එසේය..සුගන්ධිතාගේ අතින් කෑම පාර්සල් ලබා දීම ඇරඹූ ඔවුන් එය සේවක සේවිකාවන්ට පවරා කැළණි පන්සල වැඳ පුදා ගැනීමට ගියහ.සුගන්ධිතා සහ සේරසිංහ යුවළ ගේ නිවුන් දරු දෙදෙනා ඉතාමත් එකමතු විය.

උපන් දිනයෙන් දවස් දෙකකට පසු වික්‍රමසිංහ යුවළ සහ සුගන්ධිතා මිද්දෙනිය බලා පිටත් විය..ඒ සුගන්ධිතාගේ මිය ගිය පියාට පින් පිණිස දානයක්දීමටය.

" හැරී...පුංචි මැණිකට.. සුගන්ධිතා දැක්කම දුක හිතෙයි ද...? "

" ඔව් නොරීන්...අපි වෙන් කරන්න හැදුවට...දුවගේ ඇත්ත අම්මනේ ඒ...."

" මට ඒ වුණාට හිතට බයයි... දුවව එහේ ගෙනියන්න..."

" අපි.. මීට පස්සේ එහේ යන එන එක අඩු කරමු..."

" එහෙම බෑනේ හැරී..අපි ඒ මිනිස්සුන්ට උදව් කරන්න ඕනේ නේ..අපි ඒ ගොල්ලන්ට පොරොන්දු වුණත් එක්ක නේද...? "

" අනේ  නොරීන්...ඉස්සෙල්ලම අහන් ඉන්න ළමයෝ..අපි එයාලට උදව් කරනවා..එක නවත්තන්නේ නැහැ..හරිද..හැබැයි අපි..වෙනදා තරම් එහේ යන්නේ නෑ..අපි අපේ cousin ට කියමු...එයාලා ගැන හොයලා බලන්න..මේ මේ දේවල් කරන්න කියලා...ම්ම්..."

" හ්ම්ම්...එක අපි පස්සේ බලමුකෝ... "

ඒ සෙනසුරාදා වේ සවස් යාමය ගත වෙමින් තිබෙද්දී ඔවුන් මිද්දෙනිය ට ළඟා විය.වින්චැටෝ රෙස්ට් හි සුපුරුදු කාමරය ඔවුන් හට වෙන් විය.පුංචි මැනිකළගේ අලුත් දෙරදි අනිද්දා දිනයේ උදේ සාංඝික දානයක් දීමට නියමිතය

පසුදින උදයේ ම පන්සල් ගොස් දනයට අවශ්‍ය කටයුතු ද සූදානම් කර ගැනීමට දෙදෙනා කතිකා කර ගත්හ.ආරංචි වූ ආකාරයට සුගන්ධිතාගේ සොයුරියන් දෙදෙනා සහ කුඩා සොයුරා ඉතාමත් හොඳින් ඉගෙනීම් කටයුතු කරන අතර වැඩිමල් සොයුරා හොඳින් වෙළදාම් කටයුතු කරන්නේය. හැරීට සහ නොරීන්ටද සතුටු හිතුනේ ඔවුන්ගේ උදව් සහිතව මේ දේවල් සිදු වුණු නිසාය.

# 10 වන පරිච්ඡේදය

ඒ සඳුදා වේ උදෑසන ම වික්‍රමසිංහ යුවළ සහ සුගන්ධිතා පුංචි මැණිකලාගේ නව නිවහන ට ගියහ.පෙර දින රාත්‍රියේ ද හැරී විසින් මෙහි පැමිණ අදාළ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී එම කටයුතු සපුරන ලදි.එදින උදෑසන මහා සංඝ රත්නය ට පිදෙන මේ දානය සිදු කෙරුණේ වික්‍රමසිංහ යුවළ ගේ මැදිහත් වීම යෝජනාව මතය.සුගන්ධිතා ගේ වැඩිමල් සොයුරා විසින් කරඬුව හිස මත තබාගෙන විත් කරඬුව තැම්පත් කරන ගෘහයේ තැම්පත් කිරිය.ස්වාමීන් වහන්සේ ලා හත් නමගේම දෙපා දෝවනය කර පිසදැමීම සුගන්ධිතාගේ බාල සොයුරා අතින් සිදු විය..

සුගන්ධිතාගේ බාල සොයුරියන් දෙදෙනා නිතරම සුගන්ධිතා අසල ගැවසීමට උත්සාහ ගත්හ. නොරීන් ට එයින් තදබල අනුකම්පාවක් සහ බියක් ඇති විය..පුංචි මැණිකා ද දෙගමනක් ම සුගන්ධිතා ව අතට ගැනීමට උත්සාහ කරත් නොරීන් උපක්‍රමශීලීව ඇය මඟහැරියාය.ඇයට ඒ සඳහා ඉඩ ලැබුණේ දානය අවසන් වී නොරීන් සහ හැරී ස්වාමීන් වහන්සේලාට වැඳීමට සැරසෙද්දිය..ඇය ඒ අවස්ථාවේදී සුගන්ධිතාව වඩා ගත්තාය.. සුගන්ධිතාද කලබලයක් නොපෙන්විය. හැරී සහ නොරීන් ද කිසිවක් නොකීවේ ලොකු හාමුදුරුවෝ තමා ගැන වැරදි වැටහීමක් ඇති කර ගනී යැයි සිතුණු නිසාය.

දානයේ වැඩකටයුතු අහවර කල ඔවුන් නැවත වින්චැටෝ රෙස්ට් වෙත පැමිණියේ හැරීගේ ඥාති සොයුරා සමග ඉතිරි වැඩ කටයුතුද සාකච්ඡා කර ගැනීමේ අරමුණෙනි.. දෙදෙනාගේ කතා බහේ අවසන් ප්‍රතිපලය වූයේ මසකට වරක් වින්චැටෝ රෙස්ට්හි ටෙලිෆෝනයෙන් පුංචි මැණිකා තමා සමඟ කතා කර විස්තර දැන්විය යුතු බවත් එම විස්තර අනුව හැරී පවසන අයුරින් ඥාති සොයුරා වින්චැටෝ රෙස්ට්හි ආදායම් පුංචි මැණිකලාගේ කටයුතු සඳහා යෙදවිය යුතු බවත් ය.

මේ පිළිබඳ ව පුංචි මැණිකා ද එකඟ කර ගත් ඔවුන් පසු දින කොලඹ යාමට සූදානම් විය.

*********

( අවුරුදු13 කට පසු.... )

කාලයාගේ ඇවෑමෙන් සුගන්ධිතා කෙමෙන් තරුණ වියට එළඹුණි .දැන් ඇය පාළොස් හැවිරිදි යුවතියකි.හැරී සහ නොරීන් ද තරමක් මහලුය.සුගන්ධිතාගේ වැඩිමල් සොයුරා විවාහ වී දැනට අවුරුද්දකට වැඩි මිස අඩු නොවේ...සොයුරියන් දෙදෙනාගෙන් වැඩිමල් සොහොයුරිය ගුරුවරියකි.බාල සොයුරිය විශ්ව විද්‍යාල ගතව සිටින්නීය. බාල සොයුරා උසස් පෙළ පන්ති වල ඉගෙනුම ලබයි.මිත්තණිය දැන් මිය ගොසින් ය. සුගන්ධිතා කොළඹ පෞද්ගලික පාසලක 10 වසරේ ඉගෙනුම ලබයි.

ඇය ඉගෙනීමෙහි ඉතාමත් දක්ෂය.චතුර ලෙස ඉංග්‍රීසි බස හැසිරවීමට ද ඇයට හැකිය.පැහැපත් සමක් ඇති ඇය දිගු අක්බඹරු කොණ්ඩයකට උරුම කම් කීවාය..ඇය බෙහෙවින්ම පියකරුය.ලස්සනය.ඇය දුටු විට ඕනෑම කෙනෙකුට සිතෙන්නේ දැකීමත් වාසනාවක් බවය.

හැරී සහ නොරීන් එදින ගෙදරින් පිටත් වූයේ තම විදේශ ගමන් බලපත්‍ර සැකසීම සඳහාය.ඔවුන්ගේ සූදානම තම ව්‍යාපාර සියල්ලම කළමනාකරුවන් හට පවරා, ආදායම තමන්ට ලැබෙන ලෙස සකසා, පුංචිමැනිකලාටද යම් මුදලක් මාසිකව ලැබෙන්නට සලසා සුගන්ධිතා ද සමග එංගලන්තයේ පදිංචියට යාමටය.ඔවුන් කුඩා කළ සිටම සුගන්ධිතා ට ඉංග්‍රීසි බස ඉගැන්වූයේ මෙම අරමුණ නිසාමය.සුගන්ධිතාගේ හිනය වී ඇත්තේ ද වෛද්‍යවරියක් වීමය.

මේ පියවර වික්‍රමසිංහ යුවළ විසින් ගන්න ලස්සේ එංගලන්තයට ගොස් උසස් අධ්‍යාපනය හදාරා ඇයට තම බලාපොරොත්තු ඉටු කර ගැනීමට ය.මාස කීපයක් ඇතුළත ඔවුන්ගේ විදේශ ගත වීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් වුණි.නොරීන් සහ හැරී විසින් සුගන්ධිතාට නොදැනෙන ලෙස එදිනට ගුවන් තොටුපල වෙත පුංචි මැණිකා සහ දරුවන් සිව්දෙනා කැඳවාගෙන එමට කටයුතු සූදානම් කර ඇත.

වින්චැටෝ රෙස්ට්හි කළමනාකරු වන හැරී ගේ ඥාති සොයුරා විසින් එදිනට ඔවුන් කැඳවාගෙන එනු ලබයි.සුගන්ධිතා ද තම යහළුවන්, නෑදෑයින් සහ ගුරුවරුන් ට සමු දුන්නාය.නොරීන් සහ හැරී ද තම දෙමව්පියන්ට සමු දුන්හ.නොරීන් ගේ දෙමව්පියන් මේ වන විට මිය ගොසින් ය.

නොරීන් ඔවුන්ගේ පවුලේ සුසාන භූමියේ තිබුණු භෂ්මාවශේෂ තැන්පත් කර සාදන ලද තම දෙමව්පියන්ගේ සොහොන් කොත් දෙක වෙත සුදු මල් මිට බැගින් පුදා ඇඬූ කඳුළින් ඔවුන්ට සමු දුන්නාය.බංගලාවේ සේවක සේවිකාවන්ටද සමු දුන් ඔවුන් පසුදින එංගලන්තය බලා යන ගමනට සූදානම් විය.

**********

( පසු දින... )

උදෑසන ම පිබිදුණු වික්‍රමසිංහ යුවළ ගුවන් තොටුපල වෙත යෑමට සූදානම් විය.ඔවුන්ගේ හිත්වලද මේ වෙද්දි සියුම් දුකක් තැවරී නොතිබුණා නොවේ

මොකද..ඉපදුන දවසේ ඉඳ ජීවත් වුණු මේ පින්බිම හැර යනවා යන හැඟීම ඔවුන්ගේ හිතට තදින්ම කාවැදී තිබුණි.සුගන්ධිතාටද තමන්ගේ මව් බිම හැර යාමට හිත හදා ගැනීමට නොහැක්කාක් මෙනි.කෙසේවුවත් ඔවුන් අවසානයේදී ගුවන් තොටුපල වෙත ළඟා වුණි.

මේ අතර සුගන්ධිතා නොදන්නා වූත් සුගන්ධිතාගේ අම්මා, අක්කලා දෙන්නා සහ අයියලා දෙන්නා ද ඔවුන්ට සමු දෙන්නට පැමිණි පිරිස අතර සිටියහ.

ඔවුන් සුගන්ධිතා ට ඇස නොගැසෙන සේ සිටීමට ප්‍රවේශම් විය.පුංචි මැණිකා ගේ දෑසින් කඳුළු බිඳු කඩා වැටුණි.සොයුරු සොයුරියන්ගේද දෑස් තෙත් වුණි.නමුත් සුගන්ධිතා නම් මේ පිළිබඳ හාන්කවිසියක්වත් නොදනී...

අවසානයේ දී වික්‍රමසිංහ පවුල ගුවන් යානයට ගොඩවිය.පිට වීමේ සංඥාව ලැබුණු ගුවන් යානය ගුවන් පථය දිගේ ඇදී ගොස් අහසට එසැවුණි.

පුංචි මැණිකාගේ දාරක ප්‍රේමය නිසාවෙන්ම ඇයට මහා විලාපයක් පිට විය.දරුවෙකුගේ වෙන් වුණු මවකගෙ උණු කඳුළු සහ ශෝකී ස්වරයෙන් ඒ මොහොතේ වා තලයට මුසු වුණි...

" සුගන්ධිතා....."

***..නිමි..***



# පසුවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණය ට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍ය කි.එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන්වසර ගණනාවක් අඛණ්ඩව පාසල්,කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය , දියණියන් , ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම යි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකිය. මනාව දැනුම ගබඩා කර තැබීම ට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට්

බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක් වී විද්‍යුත් කෘති රචනා කරයි . තමා නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ.තමා නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

ISBN: 978-624-208-520-3